සිආදෙ/3/5/2-I

සිවිල් පාලන අංශය

සිවිල් ආරක්‍ෂක දෙපාර්තමේන්තුව

බම්බලපිටිය

2017.01. 20

චක්‍රලේඛ අංක - 02/2017

මූලස්ථාන මාණ්ඩලික නිලධාරී,

සියලුම බලකා අණදෙන නිලධාරී/ පුහුණු පාසල් අණදෙන නිලධාරීන්,

සහ ව්‍යාපෘති භාර නිලධාරීන්

<u>ප්‍රතිලාභ සඳහා ඉල්ලුම් කිරීමේදී සක්‍රිය සේවයේ යෙදී සිටින බව තහවුරු කිරීම</u>

සිවිල් ආරක්‍ෂක සාමාජිකයින් ස්ථිර හා විශ්‍රාම වැටුප් තත්වයේ පිහිටුවීමත් සමග ඔවුන් අග්‍රහාර **රක්‍ෂණ, ආපදා ණය, විශේෂ සහ උත්සව අත්තිකාරම්** ක්‍රම සමග අත්වැල් බැඳගත් අතර, මේ වනවිට ඔවුහු එහි සක්‍රිය දායකයින් බවට පත්ව සිටිති. ඒ අනුව අදාල ගොනු, මූලස්ථාන සිවිල් පාලන අංශය වෙත දෛනිකව ලැබෙමින් පවතී.

02. එම ගොනු ඉදිරිපත් කිරීමේදී, අදාල සාමාජිකයා හෝ සාමාජිකාව හට ප්‍රතිලාභයන් සඳහා හිමිකම් කිව හැක්කේ ඔහු හෝ ඇය සක්‍රිය සේවයේ යෙදී සිටින්නේ නම් පමණකි.

03. එබැවින් ඉදිරියේදී උක්ත සඳහන් කුමන හෝ ප්‍රතිලාභ ක්‍රමයක හිමිකම් ලබා ගැනීම සඳහා ගොනු ඉදිරිපත් කිරීමේදී, අනිවාර්යයෙන්ම ඉල්ලුම් කරනු ලබන සෑම සාමාජිකයෙක්/ සාමාජිකාවක් සඳහාම ඔහු හෝ ඇය සක්‍රිය සේවයේ නියුතුව සිටින බව අදාල මාණ්ඩලික නිලධාරී විසින් තහවුරු කර, ඒ බව අදාල අයදුම්පතෙහි සඳහන් කිරීමෙන් අනතුරුව, (අත්සන සහ නිල මුද්‍රාව යොදා සහතික කල යුතුය) මූලස්ථානය වෙත ලැබීමට සලස්වන මෙන් දන්වා සිටිමි.

04. එසේ තහවුරු කර නොතිබෙන ගොනු භාර නොගන්නා බව වැඩිදුරටත් දන්වමි.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්‍ෂ ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
නො: 23, දුම්රියපොළ පාර,
බම්බලපිටිය, කොළඹ-04.